# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 53 — 1973 මාර්තු 30 වැනි සිකුරාද — 1973.03.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 417 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් ... ... | 426 | රට කීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 427 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| කොටුපල් මරේන්ද හා වෙනත් මරේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**බතලගොඩ සහ වාරියපොල රජයේ ගොවිපලවල ලෙලි පොල් විකිණීම**

කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, බතලගොඩ රජයේ ගොවිපලේ ලෙලි පොල් 17,000 ක් පමණ හා වාරියපොල රජයේ ගොවිපලේ ලෙලි පොල් 10,122 ක් පමණ විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව, 1973 අප්‍රේල් මස 25 වන දින පස්වරු 2 වනතෙක් භාරගනු ලැබේ.

(i) පොල් විකිණීම සඳහා තෝරාගනු ලබන ටෙන්ඩර්කරුට ඒ බව දන්වා සති දෙකක් ඇතුලතදී ගොවිපලේ කළමනාකරුට සම්පූර්ණ පොල් තොගය සඳහා මුළු මුදල ගෙවා භාරගෙන එකී පොල් තොගය ගොවිපලින් බැහැරකරගත යුතුය. මොනම හේතුවක් නිසාවත් පොල් තොග මිළදී ගැනීම සඳහා දෙනු ලබන කාලය නැවත දීර්ඝ කරනු නොලැබේ.

(ii) පොල් තොගය භාර ගැනීමේදී කිසිම පිළිවෙලකට වර්ග කිරීම කට ඉඩ නැත. එමෙන්ම පුහුවූ හෝ කුණුවූ හෝ කුඩාවූ හෝ වශයෙන් වර්ග කිරීමටද ඉඩ නැත.

2. කුණ්ඩසාලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබාගත්තා ලද පෝරම්වල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුය. කවරයෙහි ඉහල වම් කෙළවරෙහි බතලගොඩ/වාරියපොල රජයේ ගොවිපලේ ලෙලි පොල් මිළට ගැනීම සඳහා ටෙන්ඩර් යයි සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. 1973 අප්‍රේල් මස 23 වන දින දවල් 11 වනතෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ.

තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිණි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වෙතොත්, එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර "බතලගොඩ/වාරියපොල රජයේ ගොවිපලවල ලෙලි පොල් මිළයට ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ද, ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද කවරයේ සඳහන් කොට "කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන" වෙත ටෙන්ඩර්

**සැලකිය යුතුයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. ඩී. සිල්වා,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—වයඹ දිසාව

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ, වයඹ දිසාවේ නාත්තන්ඩිය කොට්ඨාශයට ද්‍රව්‍ය සැපයීම්

නාත්තන්ඩිය විධායක ඉංජිනේරු කොට්ඨාශයේ තුම්මෝදර අලුත් දෙරටු ඉදිකරණ ස්ථානයට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා වූ ටෙන්ඩර, වයඹ දිසා බාර වැඩ අධ්‍යක්ෂ විසින් 1973 අප්‍රේල් මස 25 වැනි බදාදා පෙරවරු 10 දක්වා භාරගන්නා අතර, ටෙන්ඩර එම වේලාවෙන් පසුව නොපමාව විවෘත කරනු ලැබේ.

2. රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක රු. 15,000 කට හෝ ඊට වැඩි ප්‍රමාණයකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති පමණක් ටෙන්ඩර ඉදිරිපත් කිරීම සඳහා සුදුස්සෝ වෙති.

| සැපයිය යුතු ද්‍රව්‍ය | | ගණන |
|---|---|---|
| (i) 3″×10″ දිග 12′ ක් වූ ඉරූ හොර පලු (කුඩුම්බිය හා කුඩුම්බිවල හැරූ, පැත්තක් උල් ව සිටිනසේ සැදූ) | ... ... | 240 |

3. මගේ කාර්යාලයෙන් 1973 අප්‍රේල් මස 23 වැනි දින දක්වා රජකාරි වේලාවන් තුළ ලබා ගත හැකි ආකෘති පත්‍ර මත පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනු ලබන්නේ රු. 25 ක මුදලක් විධායක ඉංජිනේරු කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ කුවිතාන්සියක් ඉදිරිපත් කළ අයට පමණි.

5. ටෙන්ඩර් ආකෘති පත්‍ර (අනුපිටපතකින් ද යුතුව) මුද්‍රා තැබූ කවරයක බහා කවරයේ වම් පස උඩ කෙළවරේ "නාත්තන්ඩිය කොට්ඨාශය සඳහා සැපයීම්" යන්න සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් කුරුණෑගල, වයඹ දිසා භාර වැඩ අධ්‍යක්ෂ වෙත යැවිය යුතු අතර, නොඑසේ නම් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

6. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර් කරුවන්ට අවසර ඇත.

7. කුමන හෝ සියළුම ටෙන්ඩර ප්‍රශ්න කිරීමකින් තොරව නිශ්ප්‍රභා කිරීමේ සහ ටෙන්ඩරයේ කවර හෝ කොටසක් භාර ගැනීමේ අයිතිය කුරුණෑගල, වයඹ දිසා බාර වැඩ අධ්‍යක්ෂ සතුවේ.

8. මේ පිළිබඳව වැඩි විස්තර අවශ්‍ය නම් නාත්තන්ඩිය කොට්ඨාශයේ විධායක ඉංජිනේරු තැනගෙන් රජකාරි දිනවල කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැක.

එම්. ඩබ්. ඒ. එස්. විජේසිංහ,
විධායක ඉංජිනේරු කොට්ඨාශය,
නාත්තන්ඩිය.

1973 මාර්තු මස 14 වන දින,
නාත්තන්ඩිය, වි. ඉ. කාර්යාලයේ දී ය.

3–1073—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2.) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. මෙරට නිෂ්පාදිත සළු ඔප ඇඹූ වැහිකැප් සැපයීම— | 1973. 04. 24 |
| 2. මෙරට නිශ්පාදිත බැටරි සැපයීමද.— | 1973. 04. 24 |

1. 7. 73 සිට 30. 6. 74 දක්වා.

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එච්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973. 03. 30 දින,
කොළඹ දී ය.

3–1217—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුණ්ඩසාලේ පාසැල් ගොවිපලේ වියලි කොකෝ ඇට විකිණීම

අංක 48 හා 1973. 02. 23 දරණ ගැසට් පත්‍රයේ පළ කර ඇති ටෙන්ඩර් දැන්වීම පරිදි, ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය 1973. 04. 9 වැනි දින, ප. ව. 2 දක්වා දීර්ඝ කරමි. ටෙන්ඩර් පත්‍ර 1973. 04. 5 දින පෙ. ව. 11 දක්වා නිකුත් කරනු ලැබේ.

ජෙ. ශූ. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්.)

පේරාදෙණිය.
1973. 03. 15.

3–1087/1—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කටුගස්තොට ගොවිපළට පිලිස්සූ ගඩොල් 30,000 ක් සැපයීම

අංක 48 හා 1973. 02. 23 දින දරණ ගැසට් පත්‍රයේ පළකර ඇති ටෙන්ඩර් දැන්වීම පරිදි ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය 1973. 04. 6 දින ප. ව. 2 දක්වා දීර්ඝ කරමි. ටෙන්ඩර් පත්‍ර 1973. 04. 5 දින පෙ. ව. 11 දක්වා නිකුත් කරනු ලැබේ.

එච්. ටී. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්).

පේරාදෙණිය,
1973.3.15.

3–1087/2—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කටුගස්තොට බීජ මධ්‍යස්ථානයට හොඳින් මෝරණ ලද පුවක්කොට දෙසිය පණහක් (250) සැපයීම හා ගෙනගොස් භාරදීම

කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, කටුගස්තොට බීජ මධ්‍යස්ථානයට හොඳින් මෝරණ ලද දිග අඩි 20 ක් වූ පුවක්කොට 250 ක් සැපයීම හා ගෙන ගොස් භාරදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1973 අප්‍රේල් මස 11 වන දින පස්වරු 2 වන තෙක් භාරගනු ලැබේ.

2. කුණ්ඩසාලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබාගන්නා ලද පෝරමවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසි ලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි කටුගස්තොට බීජ මධ්‍යස්ථානයට පුවක්කොට සැපයීම සඳහා ටෙන්ඩර් කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 15 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. 1973. 04. 09 වන දින පෙ. ව. 11 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ.

තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිනි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වේනොත්, එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර "කටුගස්තොට බීජ මධ්‍යස්ථානයට පුවක් කොට සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන්ද, ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද කවරයේ සඳහන් කොට "කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන" වෙත ටෙන්ඩර්කරු විසින්ම හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනම, ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණි නම්, ඒ බව කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දැන්විය යුතුයි.

5. කැමති නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සළකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කලහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුගේ නම, ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කොට සති තුනක් ගතවනතුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබුවාවූද, දේවල මුළු ගණනින් සියයට පහක (5%) ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත්, පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිමවූ විට පමණි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා මෙම කොන්ත්‍රාත්තුව ඉටු නොකලහොත්, ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

10. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවලු වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

12. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ, ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේත්, කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

13. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්, මෙම කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටිය අය අතුරිණි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්තුකරුවා යම්කිසි විදියකින් අසමත් වූවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එලැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරයා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සළකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ශ්‍රී ලංකාවේ රටවැසියෙකු, අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙව්වූ පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරුවෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දැන්වීමක්ම ටෙන්ඩර් කරු අතට පත් කලාසේ සළකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වන අධිකාරය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දැක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛනයේ තනි තනිව හෝ ලේඛනයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමග හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ අධ්‍යක්ෂවරයාට හැගී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාර දීම නුසුදුස්සෙකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර කටුගස්තොට බීජ මධ්‍යස්ථානයේ කළමනාකාර තැනගෙන් දැනගත හැකිය.

ජෝ. ශු. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්).

1973. 03. 13 වන දින,
පේරාදෙණියේ දීය.

3–1173—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමට හා ගෙනගොස් භාරදීමට මිළ ගණන් කැඳවීම

පේරාදෙණියේ, ගන්නොරුවේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 අප්‍රේල් මස 23 වැනි දින ප.ව. 2.30 දක්වා පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම හා ගෙනගොස් භාරදීම සඳහා මිළ ගණන් භාරගනු ලැබේ :—

| ද්‍රව්‍ය අංකය | විස්තරය | ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| 1. (එ) | සක්කගල් 9" | කියුබ | 18 | රිකිල්ලගස්කඩ වී ගබඩා ඉදිකරණ වැඩ බිමට සැපයීමට හා ගෙන ගොස් භාරදීමට. |
| (බී) | කැටගල් 2" | කියුබ | 10 | |
| (සී) | කැටගල් 3/4" | කියුබ | 9 | |
| (ඩී) | ගඩොල් | කැට | 55,000 | |
| (ඊ) | කම්බාපු හුණු | බුසල් | 110 | |
| (එෆ්) | ගංගාවැලි | කියුබ | 35 | |

| ද්‍රව්‍ය අංකය | | විස්තරය | ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|
| 2. | (ඒ) | ඇන්ටිකොරෝසිව් (රතු තීන්ත) ... ... ... ... | ගැළුම් | 6 | |
| | (බී) | ඇනමල් තීන්ත (ක්‍රීම්) ... ... ... ... | ගැළුම් | 2 | |
| | (සී) | ඇළුමිනියම් තීන්ත ... ... ... ... | ගැළුම් | 1 | |
| 3. | (ඒ) | නො. 8 බී.ආර්.සී. පැබ්‍රික් ... ... ... ... | සතරැස් අඩි | 100 | |
| | (බී) | 1/16" කෘමි ආරක්ෂක දැල් ... ... ... ... | සතරැස් අඩි | 75 | |
| | (සී) | අඟ. 3 පිත්තල සරනේරු මැද පිවොට් ඇණ සහිත ඉස්කුරුප්පු ඇණ සමග අංග සම්පූර්ණ ... | | 16 | |
| | (ඩී) | අඟ. 3 පිත්තල කැබිත් කොකු ඇමුනුම් සිදුරු හා ඉස්කුරුප්පු ඇණ සමඟ සම්පූර්ණ ... | | 8 | |
| | (ඊ) | ඉස්කුරුප්පු ඇණ සමඟ අංග සම්පූර්ණ 6" වාහෝ, වල්ගාසරනේරු ... ... | | 3 | |
| | (එෆ්) | අඟ. 4 පිත්තල සොයිබ, ඇමුණුම් සිදුරු හා ඉස්කුරුප්පු ඇණ සමඟ අංග සම්පූර්ණ ... | | 2 | |
| | (ජී) | ඉතා හොඳ වර්ගයේ 6" පිත්තල යතුරු තහඩු යතුරු හා ඉස්කුරුප්පු ඇණ සමඟ සම්පූර්ණ | | 1 | |
| | (එච්) | මධ්‍යම ප්‍රමාණයේ යේල් ඉබියතුරු, යතුරු දෙක සමඟ සම්පූර්ණ ... ... | | 1 | |
| | (අයි) | දොර අදින මුදු, පිත්තල ... ... ... ... | | 16 | |
| | (ජේ) | කෝඩ්, බෙන්ගාල් වචයින් හෝ ඊට සමාන වර්ගය විශ්කම්භය ¼" ... ... | දික් අඩි | 200 | |
| 4. | (ඒ) | විනිවිද පෙනෙන ප්ලාස්ටික් සිහිලි තහඩු, සාමාන්‍ය ප්‍රමාණය 10' × 6'—0" (සැපයිය හැකි පරිමාණය සඳහන් කරන්න) ... ... ... ... | | 5 | |
| | (බී) | අඩි 10 දිග ඇස්බැස්ටෝස් සිලි තහඩු ... ... ... | | 35 | |
| | (සී) | අඩි 8 දිග ඇස්බැස්ටෝස් සිලි තහඩු ... ... ... ... | | 70 | |
| | (ඩී) | ඇස්බැස්ටෝස් වහල් ආවරණ (රිපිං) ... ... ... ... | ජෝඩු | 30 | |
| | (ඊ) | 6" කොකු ඇණ, ලිම්පට් වොෂර්, මුරිච්චි ආදිය සමඟ ... ... ... ... | | 500 | |
| | (එෆ්) | බොන්ඩැක්ස් ... ... ... ... | රාත්තල් | 10 | |
| 5. | (ඒ) | පදම්කල වානේ කම්බි, විෂ්කම්භය ⅜" ... ... ... | දික් අඩි | 1,500 | |
| | (බී) | පදම්කල වානේ කම්බි, විෂ්කම්භය ¼" ... ... ... | දික් අඩි | 3,000 | |
| | (සී) | 18 බී. ඩබ්. ජී. හෝ ආසන්න ප්‍රමාණයේ ජී.අයි. වයර් ... ... | හොන්ඩර | 3 | |
| | (ඩී) | 3" × 3" × ¼" ප්‍රමාණයේ යකඩ කෝණ ... ... ... | දික් අඩි | 900 | |
| | (ඊ) | යකඩ ඇණ 2" ... ... ... ... ... | හොන්ඩර | 1 | |
| | (එෆ්) | යකඩ ඇණ 3" ... ... ... ... ... | හොන්ඩර | 1 | සැපයීමට පමණයි |
| 6. | (එ) | 1½" × 9" × 9' දිග, පලමු වැනි පන්තියේ දව ... ... ... | හතරැස් අඩි | 64 | |
| | (බී) | 1 1/8" × 9" × 9' දිග, පලමු වැනි පන්තියේ දව ... ... ... | හතරැස් අඩි | 60 | |
| | (සී) | 1½" × 6" × 6" දිග, පලමුවැනි පන්තියේ දව ... ... ... | හතරැස් අඩි | 60 | |
| | (ඩී) | 4" × 3" × 6' දිග, පලමුවැනි පන්තියේ දව ... ... ... | හතරැස් අඩි | 25 | |
| | (ඊ) | 5" × 3" × 9' දිග, පලමුවැනි පන්තියේ දව ... ... ... | | 3 | |
| | (එෆ්) | 1½" × 9½" × 7' දිග තුන්වැනි පන්තියේ දව ... ... ... | හතරැස් අඩි | 125 | |
| | (ජී) | 4" × 2" × 6' දිග තුන්වැනි පන්තියේ දව ... ... ... | හතරැස් අඩි | 24 | |
| | (එච්) | 2" × 2" × 6' දිග තුන්වැනි පන්තියේ දව ... ... ... | හතරැස් රිඩි | 24 | |
| 7. | (ඒ) | අංග සම්පූර්ණ ප්ලොරසන්ට් ලාම්පු, වොට්ස් 40 අඩි 4ක් දිග තනි විදුබ්බල්බය ආවරනය සහිතව, බැටන් වයිප් ... ... ... ... | | 4 | |
| | (බී) | වෝටර් ටයිට් ඉලෙක්ට්‍රිකල් පිටිංග්ස් ... ... ... | | 2 | |
| | (සී) | අංග සම්පූර්ණ හුඩ් ලාම්පු ... ... ... ... | | 1 | |
| | (ඩී) | ඇම්පියර් 5 සොකට්ස් ... ... ... ... | | 1 | |
| | (ඊ) | ඇම්පියර් 30 මේන්ස්විච් ... ... ... ... | | 1 | |
| | (එෆ්) | බෙදහැරීමේ බෝඩ් විදුලි මාර්ග හතර, එක් මාර්ගයක් ඇම්පියර් 15 බැගිනි ... | | 1 | |
| | (ජී) | උප මාර්ග 7/044 වයර් දෙක ... ... ... ... | යාර | 100 | |
| | (එච්) | උප මාර්ග 7/0644 වයර් දෙක ... ... ... ... | යාර | 100 | |
| | (අයි) | පී. වී. සී. 1/044 වයර් ... ... ... ... | යාර | 200 | |
| 8. | (ඒ) | වීල් බැරෝ ... ... ... ... ... | | 20 | |
| | (බී) | කොන්ක්‍රීට් තාච්චි 14" ... ... ... ... | | 20 | |
| | (සී) | 10" × 8" උදළු ... ... ... ... ... | | 20 | |
| | (ඩී) | ස්පිරිට් ලෙවල් 18" ... ... ... ... ... | | 4 | |
| | (ඊ) | මේසන් ෂවල් 12" ... ... ... ... ... | | 20 | |
| | (එෆ්) | අලවංගු ... ... ... ... ... | | 6 | |
| | (ජී) | පික් ඇක්ස් ... ... ... ... ... | | 6 | |

2. මෙම සියළුම ද්‍රව්‍යයන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182 හෝ එහි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරණ ලද නියම තත්ත්වයන් අනුව තිබිය යුතුය.

3. ටෙන්ඩර් කරුවන්ට මින් කොටසකට හෝ සම්පූර්ණයෙන් හෝ ටෙන්ඩර් කළ හැක.

4. දෙපිටපතකින් සකස්කරණ ලද මිල ගණන් සඳහන් ලැයිස්තු හොඳින් මුද්‍රා තබන ලද ලියුම් කවරයක බහා " ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා මිලගණන් කැඳවීම " යන්න කවරය පිට පැත්තේ සඳහන්කර, සභාපති, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඉංජිනේරු අංශය, ගන්නොරුව, පේරාදෙණිය යන ලිපිනයට 1973 අප්‍රේල් මස 23 වැනි දින ප.ව. 2.30 ට පෙර ලැබෙන සේ එවිය යුතුය.

5. සියළුම ටෙන්ඩර්, ටෙන්ඩර් අවසාන කරණ ලද දිනයේ සිට දින 40 ක කාලයක් තුල භාරගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

6. ටෙන්ඩර් සියල්ල හෝ ඉන් කොටසක් හෝ භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය රජය සතුය.

7. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පේරාදෙණියේ ගන්නොරුවේ කෘෂිකර්ම ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු).

කෘෂිකර්ම ඉංජිනේරු අංශය,
යාන්ත්‍රික වැඩපල,
ගන්නොරුව, පේරාදෙණිය,
1973 මාර්තු මස 14 දින,

3–1258—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ඉරාප්පු ලී ඉවත් කිරීම හා මිලයට ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි

පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර කර තිබෙන ඉරාප්පු ලී මිලයට ගැනීම හා ඉවත් කිරීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ විසින් 1973 අප්‍රේල් 24 දින පෙරවරු 11.00 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. සියලුම ටෙන්ඩර් පත්‍ර, දෙපිටපතකින් යුතුව, 1973 අප්‍රේල් 23 දින දහවල් 12 දක්වා, ඒ ඒ කොට්ඨාශ වලින් සපයනු ලී හා පහත උපලේඛනගත කර ඇති ලී සම්බන්ධයෙන් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂගෙන් ද ඒ ඒ අදාල කොට්ඨාශ වලින් සපයනු ලී සම්බන්ධයෙන් එම කොට්ඨාශ භාර ඉඩම් සංවර්ධන නිලධාරීන්ගේන් ද ලබා ගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කර එවිය යුතුය.

3. කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ලංකා බැංකුවේ (යෝර්ක් වීදියේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට, ප්‍රාදේශීය ඉඩම් සංවර්ධන නිලධාරි කාර්‍යාලයට හෝ කොළඹින් බැහැර කච්චේරියක, ලී සපයනු ලබන එක් එක් මධ්‍යස්ථානය සඳහා රු. 250 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්මය ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් කවරය, බහාලූ කවරය මුද්‍රා ද තබා, එහි වම් කෙළවරෙහි ''ඉරාප්පු ලී මිලයට ගැනීම හා ඉවත් කිරීම සඳහා ටෙන්ඩර්'' යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා ඇවිලන් චතුරශ්‍රය, කොළඹ 1 යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය කවරයේ වම් පහත කෙළවරෙහි සඳහන් කළ යුතුය. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ යුතුය. නැතහොත් තමා විසින්ම ගෙනැවිත් දීමෙන් හෝ තමාගේ නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාරදිය යුතුය. එසේම එය ලැබුණු බවට කුවිතාන්සියක් ලබා ගත යුතුය.

5. කොළඹ ඇවිලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දී 1973.04.24 වන දින පෙරවරු 11ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට ඒ අවස්ථාවේ දී පෙනී සිටිය හැක.

6. ටෙන්ඩර් කිරීමට අපේක්ෂා කරන්නන් එසේ කිරීමට ප්‍රථමයෙන් ඒ ඒ අදල ඉඩම් සංවර්ධන නිලධාරීන් සමඟ සාකච්ඡා කර කාර්යාලයීය වේලාවන් තුලදී ලී පරීක්ෂා කර බැලීම යෝග්‍යය. ටෙන්ඩර්යේ ඇතිවන සියළුම වෙනස් කිරීම් හා මැකීම් ටෙන්ඩර්කරු විසින් සහතික කළ යුතුයි.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් තමන්ගේ ටෙන්ඩරය පිළිගත් බැව් දැන් වූ විට ටෙන්ඩර් කරනු ලැබූ මුදල දින 10ක් ඇතුළත දී ගෙවිය යුතුය. ඊට පසු දින 14ක් ඇතුළත දී ගන්නා ලද ලී අස්කර ගත යුතුයි. බැහැර කිරීම සඳහා තමන් විසින්ම පිළිවෙළක් යොදගත යුතුයි. දක්වනු ලැබූ කාලය තුලදී ස්ථානයෙන් ඉවත් කර ගනු නොලබන ලී නැවත විකිණීමෙන් හෝ අන් අයුරකින් හෝ ඉවත් කරනු ලැබේ. ඊට පසු ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අනු දැනුම ඇතිව විනා අන් කිසිම අයුරකින් ලී සඳහා ඉදිරිපත් විය නොහැක. යම් හෙයකින් සාර්ථකවූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව පැහැර හැරියහොත්, ඔහුගේ තැන්පත් මුදල රාජ සන්තක වනවා පමණක් නොව කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයට ද ඔහුගේ නාම ඇතුලත් වන්නේය.

8. ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම හෝ කොටස් වශයෙන් භාර ගැනීමේ හෝ නොගැනීමේ අයිතිය රජය සතුය.

9. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

10. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් දිනයේ සිට දින හැටක් ගතවනතුරු සිය මිළ ගණන් විවෘතව තැබිය යුතුය.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇවිලන් චතුරශ්‍රය
කොළඹ 1.

#### උපලේඛනය

| කොට්ඨාශය | මධ්‍යස්ථානය | විස්තරය විවිධ ප්‍රමාණයේ ඉරාප්පු ලී |
|---|---|---|
| මහියන්ගනය | ... හසලක ලී මෝල | ... හ.අ. 18,271.7 |
| ගාල්ල | ... හඳපාන්ගල ලී මෝල | ... හ.අ. 13,156.9 |
| මාන්කුලම | ... කිලිනොච්චිය ලී මෝල | හ.අ. 35,592.8 |
| මාන්කුලම | ... මාන්කුලම ප්‍රාදේශීය උප ගබඩා | |
| අනුරාධපුර | හුරුළුවැව ලී මෝල | ... හ.අ. 8,884.8 |
| | පදවිය ලී මෝල | ... හ.අ. 27,995.2 |

3—1104—73.3.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

## ජාතික කිරි මණ්ඩලය

උකුකිරි ටින් ඇහිරීම සඳහා කාඩ්බෝඩ් පෙට්ටි, ලක්ස්ප්‍රේ පිටිකිරි ඇහිරීම සඳහා පොලිතින් කවර, පැරකුම් ලේබල් සහ ලක්ස්ප්‍රේ ඇහිරීමට රාත්තලේ කඩදසි පෙට්ටි සැපයීම සඳහා සීල් කළ ටෙන්ඩර් මෙරට සැපයුම් කරුවන්ගෙන් 1973 අප්‍රේල් මස 27 දින අ.භා. 2.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

| ඇඩුරුම් ද්‍රව්‍යවල විස්තරය හා ප්‍රමාණය | සම්පූර්ණයෙන් සැපයිය යුතු ප්‍රමාණය මසකට | සම්පූර්ණයෙන් සැපයිය යුතු ප්‍රමාණය වර්ෂයකට |
|---|---|---|
| අවුන්ස 14 උකුකිරි ටින් 48ක් ඇහිරීම සඳහා පිළි සහිත කාඩ්බෝඩ් පෙට්ටි ප්‍රමාණය 18″ × 12″ × 8″ ... ... | 40,000 ... | 4,80,000 |
| උකුකිරි ටින්වල ඇලවීම සඳහා 3 × 10¼″ ප්‍රමාණයේ ලේබල් වර්ණ දෙකකින් දීප්තිමත් තනි සුදු චිත්‍ර කඩදසියක මුද්‍රණය කළ යුතුය ... ... ... ... ... ... | 20,00,000 ... | 2,40,00,000 |
| රාත්තල් 1 ප්‍රමාණයට ලක්ස්ප්‍රේ ඇහිරීම සඳහා සිදුරු කළ පොලිතින් කවර, 3½″ × 3″ × 12″ (150 ප්‍රමාණය) ... | 4,40,000 ... | 52,80,000 |
| රාත්තල් 2½ ප්‍රමාණයට ලක්ස්ප්‍රේ ඇහිරීම සඳහා සිදුරු කළ පොලිතින් කවර, 4½″ × 3″ × 14¼″ (150 ප්‍රමාණයට) ... | 3,52,000 ... | 42,24,000 |
| ලක්ස්ප්‍රේ ඇහිරීම සඳහා කඩදසි පෙට්ටි ප්‍රමාණය 270, ග්‍රෑම් ප්‍රමාණයේ පෙට්ටි කඩදසි කපා අලවා වර්ණ දෙකකින් මුද්‍රණය කිරීම ... ... ... ... ... ... | 4,40,000 ... | 52,80,000 |

ඉහත සඳහන් ද්‍රව්‍ය නාරාහේන්පිට කිරි සකස් කිරීමේ කර්මාන්තශාලාවේ සැපයුම් කළමනාකරුගේ කාර්යාලයේදී වැඩ කරන වේලාවන්හිදී පරීක්ෂා කර බැලිය හැක.

ඍජුව ගෙවනු ලබන රු. 250 ක තැන්පත් මුදලක්ද සහ ආපසු ගෙවනු නොලබන රු. 25 ක ටෙන්ඩර් ගාස්තුවක් තබන අයදුම්කරුවන්ට නාරාහේන්පිට කිරි සකස් කිරීමේ කර්මාන්තශාලාවේ සැපයුම් කළමනාකරුගෙන් 1973 අප්‍රේල් මස 26 වැනි දින අ.භා. 3.00 දක්වා මෙම ටෙන්ඩර් පත් ලබාගත හැකිය.

සභාපති,
කිරි මණ්ඩලය.

ජාතික කිරි මණ්ඩලය,
තැ.පෙ. 1155,
නාරාහේන්පිට,
කොළඹ 5,
1973.03.20 දින.

3–1211—73.3.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

### රත්මලාන කොතලාවලපුර පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුව සතු "ප්‍රජාසැල" චිත්‍රපටි ප්‍රදර්ශනය සඳහා බදුදීම

රත්මලාන කොතලාවලපුර පිහිටුවා ඇති ඉහත සඳහන් ගොඩනැගිල්ල චිත්‍රපටි ප්‍රදර්ශනය සඳහා බදුගැනීමට බලාපොරොත්තු වන සිනමා ශාලා හිමි, මෙරට පුරවැසියන්ගෙන් හා ස්වදේශීය සිනමා සමාගම් වලින් පමණක් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. මෙම ගොඩනැගිල්ල බදු දෙනු ලබන්නේ පහත සඳහන් ප්‍රධාන කොන්දෙසි වලට යටත්ව වන අතර පිළිගත් ටෙන්ඩර්කරු විසින් දුම්රිය සාමාන්‍යාධිකාරී සමග බහුපාක්ෂික ගිවිසුමකට අත්සන් කිරීමට එකඟවිය යුතුය. එම ප්‍රධාන කොන්දේසි නම්:—

(අ) ටෙන්ඩර්කරු විසින් මසකට රු. 1,250 කට නොඅඩු මුදලක් ලන්සුව වශයෙන් ඉදිරිපත් කළ යුතු අතර එම ගණන අකුරින් සහ ඉලක්කමින් සඳහන් කළ යුතුය.

(ආ) අදාල බහුපාක්ෂික ගිවිසුම ආරම්භයේ දී අවුරුදු දෙකකට පමණක් සීමා වනු ඇත. එහෙත් දුම්රිය සාමාන්‍යාධිකාරිගේ අභිමතය පරිදි දීර්ඝ කිරීමටද භාජනය විය හැකිය.

(ඇ) සාර්ථක ටෙන්ඩර්කරු විසින් රු. 5000 ක් සහ දෙමසකට වැටහෙන කුලිය දෙපාර්තමේන්තුව වෙත තැන්පත් කළ යුතුයි.

(ඈ) ඔහු විසින් "ප්‍රජාසැල" ට අයත් දේපල දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නියම කරන ලද මුදලකට ගින්නෙන් රක්ෂණය කළ යුතුයි.

(ඉ) ඔහු විසින් පළාත් පාලන ආයතනයට ගෙවිය යුතු සියළුම ගෙවීම කල යුතු අතර පරිභෝජනය කරන ලද විදුලී බලය සඳහා සම්මත පරිදි ගෙවිය යුතුයි.

(ඊ) තවද අවශ්‍ය වූ අවස්ථාවක දී දෙපාර්තමේන්තු අවශ්‍යතා වන්ට "ප්‍රජාසැල" නිදහස් කර දිය යුතුය.

(උ) මෙයට අමතරව පිළිගත් කොන්දේසි අන්තර්ගත බහු පාක්ෂක ගිවිසුමකටද අත්සන් කල යුතුයි.

ඉහත සඳහන් කර ඇති කොන්දේසි එකක් හෝ කීපයක් කඩ කිරීම බදුකරය අවලංගු කිරීමට හේතු වෙනවා ඇත.

3. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන්නන් 1973 අප්‍රේල් 6 වෙනි දිනට පෙර ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී වෙත රු. 10 ක් තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සිය ඉඩම් නිලධාරී වෙත ඉදිරිපත් කිරීමෙන් ආකෘති පත්‍රය ලබාගත යුතුයි. ආකෘති පත්‍රය නියම අත්දමින් සම්පූර්ණකොට 1973 අප්‍රේල් 23 දින පස්වරු 2 ට පෙර "ප්‍රජාසැළ සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් ලියුම් කවරයේ උඩ කෙළවර සඳහන් කොට, ප්‍රධාන ඉංජිනේරු, ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 370, කොළඹ 10 යන ලිපිනයට අතින් හෝ තැපෑලෙන් භාරදිය යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු නොලැබේ.

4. මෙයට අදාල ටෙන්ඩර් මණ්ඩලය ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රධාන ඉංජිනේරු සහ ඉඩම් නිළධාරීන්ගෙන් සමන්විත වන අතර මේ සම්බන්ධ පැනනගින සෑම කරුණක් සඳහාම දුම්රිය සාමාන්‍යාධිකාරිගේ තීරණය අවසන් තීරණය වේ. තවද ලැබී ඇති ටෙන්ඩර්වලින් එකක් පිළිගැනීම හෝ කරුණු නොදක්වා සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කිරීමේ අයිතියද දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තබාගෙන ඇත.

වී. පී. නවරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැපැල් පෙට්ටිය අංක 355,
කොළඹ,
1973 මාර්තු 30 දින.

3–1246—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, 200 කිරුළ පාරේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා 1973 අප්‍රේල් 20 වැනි දින පෙ. ව. 10 වනතෙක් සීල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු ලැබේ.

| වැඩ විස්තරය | කොන්ත්‍රාත් කරුවන්ගේ අවම ලියාපදිංචි සීමාව රු. ශ. |
|---|---|
| 1. මහරගම ඩිපෝව— වැඩ තොටු 5 ක් සහ සේවා තොටු 2 ක් තැනීම— ඉසි/493 ... | 1,00,000 00 |
| 2. කළුතර ඩිපෝවේ ගොඩනැගිලි පාරවල් සහ අංගනය තැනීම ඉසි/538 ... | 1,50,000 00 |
| 3. මැදවච්චිය—භූමිය පස් කපා සමතලා කිරීම ඉසි/417 ... | 35,000 00 |

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල, පිළිවෙල කොට අනුපිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය සියලුම විස්තර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර, අදාල සැලසුම් ආදිය ඔහුගේ කාර්යාලයේ දී පරීක්ෂා කළ හැක. ලංගම, රජයේ දෙපාර්තමේන්තුවල හෝ පිළිගත් සංස්ථාවල සිවිල් ඉංජිනේරු වැඩ සඳහා එක් එක් වැඩයට ඉදිරියෙන් පෙන්වා ඇති හෝ ඊට අධිකව ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති.

අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් වැඩ අංක 1 සහ 3 සඳහා එකකට රු. 100 බැගින්ද, අංක 2 සඳහා රු. 200 ක්ද ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ෆෝර්ම ගාස්තු වශයෙන් අංක 1 සහ 3 සඳහා එකකට රු. 25 බැගින්ද, අංක 2 සඳහා රු. 40 ක්ද ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත 1973 අප්‍රේල් 19 වෙනි දින දහවල් 12 ට හෝ ඊට පෙර ගෙවා, එම කුවිතාන්සි මා වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

තවද, ටෙන්ඩර්කරුවන් සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ප්‍ර.ගි.නි. තැන වෙත මුදලින් තැන්පත් කළ හැක්කේ එම සහතික පත් පිළිගනු ලැබුවේ නම් පමණි.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනා ගමන මණ්ඩලය.

අංක 200, කිරුළ පාර,
කොළඹ 5.

3–1242—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

දැන්වීමයි

පහත සඳහන් විස්තර වලින් යුත් බේලර් නූල් සැපයීම සඳහා දේශීය නූල් නිෂ්පාදකයින්ගෙන් මිළ ගණන් භාරගනු ලැබේ.

විස්තර.—ස්වයංක්‍රීය බේලර් යන්ත්‍ර මගින් පිදුරු බේල් කිරීම සඳහා සුදුසු බේලර් නූල් ඉතා පිරිසිදු විය යුතු අතර, එය නිමකර ඇති කෙඳි වර්ගය යන්ත්‍රයේ ධාවන වේගයට ඔරොත්තු දිය යුතුයි.

**කාර්මික යෝග්‍යතා.**—රාත්තලක් අඩි 225.

සාමාන්‍ය ඇදීමේ ශක්තිය රු. 325.

කෘමි උවදුරුවලට භාජනය නොවනසේ නූල් සකස්කර තිබිය යුතුයි.

නූල් රෝදයේ විෂ්කම්භය 10" විය යුතුයි.

**වාර්ෂික අවශ්‍යතා.**—නූල් සහිත රෝද 8000 යි.

එක් රෝදයක් බර රාත්තල් 18-20 දක්වා විය යුතුයි.

"බේලර් නූල් සඳහා මිළ ගණන්" යනුවෙන් සඳහන් කර ආදර්ශ සහිතව, මාසිකව සැපයිය හැකි ප්‍රමාණය දක්වමින්, 1973, අප්‍රේල් 10 වෙනි දින පස්වරු 2 ට පෙර පහත සඳහන් ලිපිනය වෙත මිළ ගණන් ඉදිරිපත් කළ යුතුයි.

සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
කොළඹ 2, 1973.03.08.

3–1231—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

### රාජ්‍ය දැව සංස්ථාව

#### වාහනයක් විකිණීම

අංක 24 ශ්‍රී 1600 දරණ "ස්ටෙයර් බෙන්ස් ට්‍රක් රථය" අංක 44 ශ්‍රී 1465 දරණ ට්‍රේලරයත් සමග විකිණීම සඳහා 1973.04.24 දින පස්වරු 2 දක්වා සීල් තබන ලද ටෙන්ඩර් භාරගනු ලැබේ.

1973.04.23 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන අයට, දැනට මෙම සංස්ථාවට අයත්, ඌරුගොඩවත්ත දැව ගබඩාවේ ඇති මෙම වාහනය එම ගබඩාව භාර නිලධාරී මහතාගේ අවසරය ඇතිව කාර්යාලයීය වේලාවන් තුළ දී පරීක්ෂාකර බැලිය හැක.

නැවත ගෙවනු ලබන රුපියල් සියයක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා ටෙන්ඩර් ගාස්තු වශයෙන් නැවත නොගෙවනු ලබන රුපියල් දහයක මුදලක් තැන්පත් කර ක්‍රියාකාරී කළමනාකරුගේ කාර්යාලය වෙතින් ටෙන්ඩර් ආකෘති පත්‍ර හා කොන්දේසි ලබාගත හැකිය.

වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී කළමනාකරු වෙතින් ලබාගත හැක.

සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව.

1973 මාර්තු මස 21 වැනි දින,
රාජ්‍ය දැව සංස්ථාව,
7, වජිර පටුමග,
කොළඹ 5.

3–1241—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

#### ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවීම

පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා 1973 අප්‍රේල් මස 19 වැනි දින ප. ව. 2. 30 දක්වා පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

(1) හොඳින් පුළුස්සන ලද මධ්‍ය ප්‍රමාණයේ හොඳ වර්ගයේ ගඩොල් 1000 බැගින්,

(2) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ ගංගා වැලි කියුබ් එක බැගින්,

(3) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ අඟල් 3/4 සහ අඟල් 1 1/2 කැටගල් කියුබ් එක බැගින්,

(4) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ තම්බන ලද හුණු බුසල බැගින්,

(5) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ අළුහුණු බුසල් එක බැගින්.

මෙම ද්‍රව්‍යයන් උඩුගොඩ සත්ව ගොවිපලට ගෙනැවිත් භාරදිය යුතු සහ රජයේ වාහනවලට පටවා දිය යුතු මිල ගණන් වෙන වෙනම පැහැදිලිව සඳහන් කළ යුතුය.

2. මෙම සියලුම ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182 හි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරණ ලද නියම තත්ත්වයෙන් තිබිය යුතුය.

3. මෙම එක් ද්‍රව්‍යයකට හෝ සෑම ද්‍රව්‍යයකටම හෝ ටෙන්ඩර් ඉල්ලුම් කළ හැකිය.

4. මේ සඳහා ටෙන්ඩර් ආකෘති පිටපත් දෙකකින් යුතුව තමන් විසින් පිළියෙල කොට ටෙන්ඩර් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "උඩුගොඩ සත්ව ගොවිපලේ ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා මිල ගණන්" යන්න සඳහන් කොට සියළුම ටෙන්ඩර් අත්සන් තබා සීල් කර සුරක්ෂිතව ලේඛණගත තැපෑලෙන් 1973 අප්‍රේල් මස 19 වැනි දින පස්වරු 2.30ට පෙර "සභාපති, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය, ඉංජිනේරු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන ලිපිනයට එවිය යුතුය.

5. සියළුම ටෙන්ඩර්, ටෙන්ඩර් අනුමත කරණ ලද දිනයේ සිට දින 40 ක කාලයක් භාර ගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

6. ටෙන්ඩර් සියල්ල හෝ කොටසක් හෝ එකක් හෝ භාර ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සම්පූර්ණ බලය දෙපාර්තමේන්තුව සතුය.

7. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි) තැනගෙන් අසා දැනගත හැක.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 මාර්තු මස 13 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සිවිල් ඉංජිනේරු අංශයේ දීය.

3–1255—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

#### වාහන විකිණීම

##### වෝක්ස්වාගන් කාර් එක 3 ශ්‍රී 1577

##### ඩොජ් (ටොන් 3) ලොරිය සී. එල්. 5054

ඉහත සඳහන් වාහන විකිණීම සඳහා 1973. 04. 09 වෙනි දින දහවල් 12 වන තුරු පහත අත්සන් කරන අය විසින් සීල් තබන ලද කවරයක බහා ලන ලද මිල ගණන් භාර ගනු ලැබේ. ආපසු ගෙවනු ලබන රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා රු. 10 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවීමෙන් පසු 1973 04. 06 වෙනි දින පස්වරු 2 දක්වා සැපයීම් අංශයෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැකිය. වාහන පරීක්ෂාකිරීම සංස්ථා ප්‍රවාහන අංශයේදී (ටොරින්ටන් චතුරශ්‍රය) කාර්යාලයීය වේලාවන් තුල කළ හැකිය.

මිල ගණන් ඉදිරිපත් කරන කවරය සීල් තබා එහි වම්පස උඩ කෙළවරේ "රථ වාහන විකිණීම" යනුවෙන් සඳහන් කොට, මුදල් අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, තැ. පෙ. 574, කොළඹ 7 යන ලිපිනයට ලියාපදිංචිකළ තැපෑලෙන් එවිය යුතුයි. එසේ නැත හොත් මුදල් අධ්‍යක්ෂගේ කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුයි. 1973.04.10 වෙනි දින පෙරවරු 10 ට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභා ශාලාවේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන කාර්යාලයට ඇතුලත් කරනු ලබන්නේ ටෙන්ඩර් රිසිට් පත් රැගෙන එන අය පමණී.

මුදල් අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව.

කොළඹ 7,
1973 මාර්තු මස 30 වෙනි දින.

3–1162—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### ධීවර දෙපාර්තමේන්තුව

ධීවර දෙපාර්තමේන්තුවේ පහත සඳහන් කාර්යයන් සඳහා 1973.04.19 වැනි දින පූ. භා 10.30 දක්වා කොළඹ ධීවර අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(1) ප්‍රධාන කාර්යාලයට අමතර ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා සිමෙන්ති මාළු වැංකි 2 ක් තැනීම.

(2) දොර හා පැද්දෙන දොර සවි කිරීම සහ ආපන ශාලාවේ මුළුතැන් ගෙය ප්‍රතිසංස්කරණය කිරීම.

ටෙන්ඩර් පත්‍ර 1973.04.18 වැනි දින දහවල් 12 වන තෙක් කොළඹ ගාළුමුවදොර ධීවර දෙපාර්තමේන්තුවේ ආයතන ශාඛාවෙන් ලබාගත හැකිය. එක් එක් ටෙන්ඩර් වෙනුවෙන් ටෙන්ඩර් තැන්පත් මුදල රු. 100 කි. මෙම තැන්පත් මුදල් ආපසු ලබාගත හැකි වනු ඇත.

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

කොළඹ 3, ගාළුමුවදොර,
ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

3–1136—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

### සුරාබදු දෙපාර්තමේන්තුව

### කළුතර අංක 2 සුරාබදු ගුදමේ ඇති පාවිච්චියට නොගන්නා හිස් බෝතල් විකිණීම සඳහා මිලගණන් කැඳවීම

කළුතර අංක 2 සුරාබදු ගුදමේ ඇති පාවිච්චියට නොගන්නා සුදු හිස් බෝතල් ගැලුම් 3,500 ක් සහ දුඹුරු හිස් බෝතල් ගැලුම් 500 ක් ද විකිණීම සඳහා මුද්‍රා තැබූ මිලගණන් පත්‍ර 1973 අප්‍රේල් මස 23 වැනි දින මධ්‍යාහ්න 12 දක්වා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු කොමසාරිස් විසින් භාරගනු ලැබේ.

ගැනුම්කරුවන් විසින් බෝතල් ගැලුමකට ගෙවීමට අදහස් කරන මිල ප්‍රමාණය හා ගැනීමට අදහස් කරන බෝතල් ප්‍රමාණයද සඳහන් කළ යුතුවේ. වැඩකරන සාමාන්‍ය වේලාවන් ඇතුළත මෙම හිස් බෝතල් කළුතර අංක 2 සුරාබදු ගුදමේදී පරීක්ෂා කර බැලිය හැකිය.

ජේ. බ. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

1973. 03. 14 වන දින,
කොළඹ දීය.

3–1182—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ඉම්පීරියල් ගැලුම් 4 හතරැස් ටින් සහ රාත්තල් 36 හතරැස් ටින් සැපයීම සඳහා ටෙන්ඩර් පත්

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඉහත සඳහන් දෑ සැපයීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

ආපසු ලබා ගත හැකි රුපියල් 100 ක තැන්පත් මුදලක් ගෙවීමෙන් පසු ටෙන්ඩර් පත් කොන්දේසි ගබඩා හා සැපයීම් කළමනාකරුගේ කාර්යාලයෙන් ලබාගත හැක.

1973. 04. 19 වෙනි දින පෙරවරු 10 තෙක් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

113, ගාලු පාර,
කොළඹ 3.

3–1232—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### ජයසූරිය වත්තේ බංගලාව කඩා ඉවත් කරගෙන යාම පිණිස මිල ගණන් කැඳවීම

පුත්තලම දිස්ත්‍රික්කයේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ජයසූරිය වත්තේ තිබෙන බංගලාව කඩා ඉවත්කරගෙන යාම පිණිස 1973 අප්‍රේල් 24 වැනි දින පෙරවරු 10 දක්වා පුත්තලම් කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මිල ගණන් භාරගනු ලැබේ.

ඉහත සඳහන් බංගලාව 1973 අප්‍රේල් 10 වැනි දින සිට 1973 අප්‍රේල් 21 වැනි දින දක්වා පරීක්ෂාකර බැලිය හැකිය.

1973 අප්‍රේල් මස 26 වැනි දින පස්වරු 3 ට මිල ගණන් පත් විවෘත කරන අවස්ථාවේ ඉල්ලුම්කරුවන්ට එහි පැමිණ සිටීමට ඉඩදෙනු ලැබේ.

1973 අප්‍රේයෙල් 23 වැනි දින පෙරවරු 12 දක්වා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට, ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති, හා සමුපකාර සමිතිවලටද පුත්තලම් කච්චේරියෙන් මිල ගණන් පෝරම නිකුත් කරනු ලැබේ.

ඉල්ලුම්කරුවන් විසින් පුත්තලම කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ ඉහත සඳහන් වැඩය සඳහා රු. 25 ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් පුත්තලම් දිසාපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව මිල ගණන් පෝරම නිකුත් කරනු ලැබේ. මිල ගණන් ඉදිරිපත් කළ යුත්තේ ඉහත සඳහන් පරිදි ලබාගත් ආකෘති පත්වලය.

ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථමයෙන් රු. 250 ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුය. අනුමත මිල ගණන් ඉදිරිපත් කළ තැනැත්තා විසින් දින 3 ක් ඇතුළත සම්පූර්ණ මුදල හා ඇප මුදල දිසාපති වෙත ගෙවා ගිවිසුම අත්සන් කර දින තිහක් ඇතුළත ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් කඩා ඉවත් කරගත යුතුය.

නියමිත කාලය ඇතුළත ගොඩනැගිල්ල කඩා ඉවත් කර නොගත හොත් ඇප මුදල් ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් ගිවිසුම අත්සන් කළ පසුව ආපසු ගෙවනු ලැබේ.

මුද්‍රා තබන ලද මිල ගණන් පත් පුත්තලම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැක. නැතහොත් ලියාපදිංචි තැපැල් මගින් නියමිත දිනයට පෙර එවිය යුතුය. ලියා පදිංචි තැපැල් මගින් එවන ලිපි කවරයේ වම් උඩු පසින් "ජයසූරිවත්ත බංගලාව කඩා ඉවත් කිරීම" යනුවෙන් සඳහන් කර 'සභාපති ටෙන්ඩර් මණ්ඩලය, දිසාපති කාර්යාලය, පුත්තලම' යන ලිපිනයට එවිය යුතුය.

ඩ. සූ. විජේවීර,
පුත්තලම දිසාපති.

1972. 12. 15 වැනි දින,
පුත්තලම දිසාපති කාර්යාලයේ දීය.

3–1074—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

අංකය : කිව්. ඩී. 11/73.

### පොලිස් දෙපාර්තමේන්තුවට කැප් තොප්පි 10,000 ක් සැපයීම

ප්‍රාදේශිකව ලබාගත හැකි මූල ද්‍රව්‍යවලින් සාදන ලද කැප් තොප්පි 10,000 ක් සැපයීම සඳහා 1973. 04. 24 දින පෙ. ව. 10 දක්වා කොළඹ 1, තැ. පෙ. 517, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ඉහත සඳහන් වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එතනට පැමිණ සිටීමට ටෙන්ඩර් කරුවනට අවසර දෙනු ලැබේ.

3. පොලිස් මූලස්ථානයේ පොලිස්පතිගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පිළියෙළ කළයුතුය. අවශ්‍ය කැප් තොප්පි සාම්පල සාමාන්‍ය වැඩ කරන වේලාවන්හිදී පොලිස් මූලස්ථානයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 250 ක් තැන්පත් කොට ඒ බවට ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1973. 04. 23 දින දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැකිය. තැන්පත් මුදල් පොලිස් මූලස්ථානයේ හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

5. සැම්පලයක් ඉදිරිපත් කළ යුතුය. මෙය ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයට පෙර ටෙන්ඩර්කරුගේ නම සඳහන් ලේබලයක් සමඟ පොලිස් මූලස්ථානයේ තැන්පත් කළ යුතු ය.

6. වැඩි විස්තර පොලිස් මූලස්ථානයෙන් දැනගත හැකි ය.

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

1973. 3. 19 දින,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේදීය.

3–1202—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### ඊයම් සුන්බුන් සැපයීම සඳහා මිල ගණන් කැඳවීම

ඊයම් සුන්බුන් ටොන් 25 ක් සැපයීම සඳහා 1973 අප්‍රේල් මස 10 වැනි දින පෙරවරු 10 වනතෙක් රු. 50 ක ආපසු ලබා ගත හැකි තැන්පත් මුදලක් ගෙවා මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම මාර්ගයෙන් මිල ගණන් භාර ගනු ලැබේ.

මිලට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහභාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර,
කොළඹ 5.

3–1142—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

### ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

කොල්ලුපිටියෙහි ගාලු පාරෙහි අංක 137 දරණ ඇතට පවතින පැරණි පොලිස් ස්ථාන ගොඩනැගිල්ල මිළට ගැනීම, කඩා බිඳ දැමීම සහ ඉවත් කිරීම සඳහා ටෙන්ඩර, 1973 අප්‍රේල් 6 වැනි දින ප.ව. 2.30 දක්වා කොළඹ 7, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, කොළඹ කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයෙහි කොට්ඨාශ ටෙන්ඩර මණ්ඩලයෙහි සභාපති විසින් භාරගනු ඇත.

2. කොළඹ 7, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බටහිර කොළඹ, දිස්ත්‍රික් ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුතුව පිළියෙල කොට ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුය. එකී දිස්ත්‍රික් ඉංජිනේරුගෙන් මේ සම්බන්ධයෙන් සියලු විස්තර ලබාගත හැකිය.

3. කොළඹ 1, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයයෙහි ගොඩනැගිලි අධ්‍යක්ෂ විසින් හෝ කොළඹින් පිටත වන ඕනෑම කච්චේරියක් විසින් හෝ නිකුත් කරන ලද රු. 1,000 ක ටෙන්ඩර තැන්පතු කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, ටෙන්ඩර එවීමට බලාපොරොත්තුවන පුද්ගලයින්ට, බටහිර කොළඹ දිස්ත්‍රික් ඉංජිනේරු විසින් 1973 අප්‍රේල් 4 වැනි බදාදා ප. ව. 2.30 වන තෙක් ටෙන්ඩර ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත. ටෙන්ඩරය පිළිගත් දින සිට මාසයක් ඇතුළත, ගොඩනැගිලි කඩා බිඳ දමා සියලු ද්‍රව්‍ය සහ සුන්බුන් ඉවත් ක්‍රීම සාර්ථකව සම්පූර්ණ කළ විටදී ඉහත කී මුදල ආපසු ගෙවනු ඇත.

4. ටෙන්ඩර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් කොළඹ 7, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කොළඹ කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය. ටෙන්ඩර මුද්‍රා තබන ලද ලියුම් කවරවල බහා, එම කවරවල මුදුනේ වම් කලෙවරේ "කොල්ලුපිටියෙහි පැරණි පොලිස් ස්ථාන ගොඩනැගිල්ල මිළට ගැනීම, කඩා බිඳ දැමීම සහ ඉවත් කිරීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් ලියා සළකුණු කළ යුතුය.

5. 1973 අප්‍රේල් 6 වැනි සිකුරාදා ප. ව. 3 ට ටෙන්ඩර විවෘත කරනු ඇත. ටෙන්ඩර විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර කරුවන්ට හෝ ඔවුන්ගේ පිළිගත් නියෝජිතයන්ට හෝ එහි ඇවිත් සිටිය හැකිය.

6. කඩා බිඳ දැමීම සහ සියලු ද්‍රව්‍ය සහ සුන්බුන් ඉවත් කිරීම, ටෙන්ඩරය පිළිගත් දින සිට මාසයක් ඇතුළත අවසාන කිරීමට සාර්ථක ටෙන්ඩරකරුට හැකිවිය යුතුය. මෙසේ කළ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර තැන්පතුව රාජසන්තක කරනු ලැබීමට ද, ඔහුගේ නම රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබීමට ද ඉඩ ඇත.

එම්. කුමාරස්වාමි,
කොළඹ කොට්ඨායෙහි අධිකාරි ඉංජිනේරු.

තැ. පෙ. 1355,
කොළඹ 7.

3–1137—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

**අනුරාධපුර/මැදවච්චිය/ත්‍රිකුණාමලය සහ පොළොන්නරුව දිස්ත්‍රික් ඉංජිනේරු කායර්‍යාලයන්හි ඇති හිස් සිමෙන්ති උර මිලදී ගැණීම සඳහා මිල ගණන් කැඳවීම**

ත්‍රිකුණාමලය ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයේ ඇති හිස් සිමෙන්ති උර 14,000 ක්ද, අනුරාධපුර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයේ ඇති හිස් සිමෙන්ති උර 12,000 ක්ද, මැදවච්චිය ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයේ ඇති හිස් සිමෙන්ති උර 2,000 ක්ද, පොළොන්නරුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලයේ ඇති හිස් සිමෙන්ති උර 1,000 ක්ද, මිලදී ගැනීම සඳහා වූ මිල ගණන් 1973.04.18 වන දින උදේ 10 දක්වා අනුරාධපුර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ උතුරු මැද කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ප්‍රාදේශීය ගැණුම්පත් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

මිල ගණන් දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, කවරයේ වම්පස උඩ කෙළවරේ "හිස් සිමෙන්ති උර මිලදී ගැණීම සඳහා මිල ගණන්" යනුවෙන් සඳහන් කර, අනුරාධපුර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, උතුරු මැද කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ගැණුම්පත් මණ්ඩලයේ සභාපති වෙත ලිපිනය කර එවිය යුතුය.

අවශ්‍ය වැඩි විස්තර සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අනුරාධපුර, මැදවච්චිය, ත්‍රිකුණාමල හා පොළොන්නරුව දිස්ත්‍රික් ඉංජිනේරු වරුන්ගෙන් විමසන්න.

කේ. සිවප්‍රගාසම්,
උතුරු මැද කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු
(ගොඩනැගිලි) අනුරාධපුරය.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
අනුරාධපුරය,
1973 අප්‍රේල් මස 15 වෙනි දින.

ය–1208—73.03 30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

## තීරණයකළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම්

අංකය : කිව්. ඕ. 81/72.

**පොලිස් දෙපාර්තමේන්තුව—ටෙන්ඩර් තීරණ**

වැහි කබා 5,000 ක් සැපයීම

විවෘත කළ දිනය : 1972. 12. 27

1972.12.01 දින නිකුත් වූ රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද ඉහත සඳහන් සැපයීම පිළිබඳ ටෙන්ඩරය සම්බන්ධයෙන්, ටෙන්ඩර්කරුවන් 5 දෙනෙකු විසින් මිලගණන් 8 ක් ඉදිරිපත් කරන ලදී. තෝරාගත් ටෙන්ඩර්කරු පිළිබඳ විස්තර පහත දැක්වේ.

එස්. එල්. එම්. ගවුස් සහ සමාගම,
115, 3 වැනි හරස් වීදිය,
කොළඹ 11.

භාරගත් මිලගණන එක් වැහි කබායකට රු. 66.95 යි.

ජී. පුංචිමහත්මයා,
පොලිස්පති වෙනුවට.

පොලිස් මූලස්ථානය,
කොළඹ 1,
1973 මාර්තු මස 20 වැනි දින.

3–1201—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව—ටෙන්ඩර් ප්‍රතිඵල

| ටෙන්ඩර් පියවූ දිනය | විෂයය | ලැබුණු ටෙන්ඩර් පත් ගණන | පිළිගත් ටෙන්ඩර්කරු | ඒකකය | පිළිගත් මිළ රු. ශ. |
|---|---|---|---|---|---|
| (1) 1972.09.21 ... | කාකි පික් තොප්පි 2,000 ... | දෙකයි ... | කොළඹ 1, රෝහල් වීදියේ අංක 27 හි, ආමි ඇන්ඩ් නේවි ස්ටෝර්ස් | එකක් ... | 49 74 |
| (2) 1972.11.28 ... | 1973 සඳහා ගුදිරි කොහු සහ පිරපු කොහු | දෙකයි ... | නාරම්මල 'අරවින්ද' හි බී. ඒ. රණවීර මහතා —විෂය අංක 2 | හොණ්ඩරය ... | 42 0 |
| | | | අංගොඩ කුඩා බුත්ගමුවේ අංක 7 4හි ඇම්. ඩී. චාර්ල්ස් මහතා—විෂය අංක 1 | හොණ්ඩරය ... | 15 45 |
| (3) 1972.12.05 ... | 1973 සඳහා කපු කැන්වස් ... | දෙකයි ... | ටෙන්ඩරය ප්‍රතික්ෂෙප කරන ලදී ... | — ... | — |

සැ. ඔ. පෙ. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973.3.19 දින,
කොළඹ 2,
රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ දිය.

3–1218—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## රේගුවේ ස්වර්ණාභරණ වෙන්දේසිය

පහත දක්වෙන භාණ්ඩ, 1973 අප්‍රේල් 5 වැනි දින කොළඹ ශ්‍රී ලංකා රේගුවේ ගමන් බඩු කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. පෙ. ව. 9ට වෙන්දේසිය ආරම්භ වෙයි. අප්‍රේල් 4 වැනි දින පෙ. ව. 9 සිට දවල් 12 දක්වාත් ප. ව. 1 සිට ප. ව. 3.15 දක්වාත් භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා තබනු ඇත.

(1) මුතු සහ රතුකැට ඇල්ලූ රන් මාලයක්.
(2) මුතු ඇල්ලූ කරාබු ජෝඩුවක්.
(3) මුතු ඇල්ලූ කරාබු ජෝඩුවක්.
(4) සිට (14) දක්වා, එකකට කෆ්ලින්ක්ස් ජෝඩුවක් බැගින්,
(15) විවිධ ගල් ඇල්ලූ රිදී පදක්කමක්
(16) විවිධ ගල් ඇල්ලූ රිදී පදක්කමක්
(17) සිට (24) දක්වා, එකකට රිදී මූන්ස්ටෝන් පැන්ඩන්ට් එකක් බැගින්
(25) රන් දම්වැලක්
(26) සුදු ගල් ඇල්ලූ කරාබු ජෝඩුවක්
(27) රන් වළළු ජෝඩුවක් (මැෂින්කට්)
(28) මාත්තු රත්රන් දම්වැලක්
(29) කැබලි තුනකට කැඩී පලුදුවූ රන් දම්වැලක්
(30) රන් පවුමක් සහිත රන් පදක්කමක්
(31) පලුදුවූ රන් මුද්දක්
(32) පලුදුවූ රන් මුද්දක්
(33) රන් පවුමක් සහිත පදක්කමක් ඇල්ලූ රන් දම්වැලක්
(34) රන් මුද්දක්
(35) දියමන්ති ඇල්ලූ කාන්තා මුද්දුවක්
(36) දියමන්ති මුද්දක්
(37) දියමන්ති මුද්දක්
(38) දියමන්ති කරාබු ජෝඩුවක්
(39) දියමන්ති ගලක්
(40) දියමන්ති ගල් හතරක්
(41) සිට (46) දක්වා, එකකට දියමන්ති ගල් පහ බැගින්
(47) දියමන්ති ගල් තුනක්
(48) ගාතට් ඇල්ලූ බ්‍රෙස්ලට් එකක්
(49) විවිධ ගල් ඇල්ලූ බ්‍රෙස්ලට් එකක්
(50) ගාතට් ඇල්ලූ මාලයක්
(51) විවිධ ගල් ඇල්ලූ කරාබු ජෝඩුවක්
(52) නිල් ගල් නමයක් ඇල්ලූ කැරට් නවයේ රන් මුද්දක්
(53) නිල් ගල් නවයක් ඇල්ලූ කැරට් නවයේ රන් මුද්දක්
(54) වළළු ජෝඩුවක් (කැරට් 14 රත්රන්)
(55) වළළු ජෝඩුවක් (කැරට් 14 රත්රන්)
(56) වළළු ජෝඩුවක් (කැරට් 14 රත්රන්)
(57) "පින්ක් සැපයර්" ගල් ඇල්ලූ මාත්තු රත්රන් මුද්දක්
(58) බාපල් මුද්දක්—මාත්තු රත්රන්
(59) කෘත්‍රිම නිල්ගල්, රතුකැට සහ එමරල්ඩ් ඇල්ලූ මුද්දක්—මාත්තු රත්රන්
(60) එම
(61) එම
(62) නිල්ගල් ඇල්ලූ පොකුරු මුද්දක්—මාත්තු රත්රන්
(63) නිල් ගල් තුනක් ඇල්ලූ සුදු රත්රන් මුද්දක්.
(64) රන් වළළු ජෝඩුවක්
(65) රන් වළළු ජෝඩුවක්
(66) එනමල් වළළු ජෝඩුවක්—මාත්තු රත්රන්
(67) ප්ලාස්ටික් එබ්බූ වලලු ජෝඩුවක්— මාත්තු රත්රන්
(68) රන් පදක්කමක් සහිත රන් දම්වැලක්
(69) රන් පවුමක් ඇල්ලූ රන් පදක්කමක්
(70) රන් කරාබු ජෝඩුවක්
(71) ජිප්සි ජෝඩුවක්
(72) ඉමිටේෂන් ගල් ඇල්ලූ කරාබු—ජෝඩුවක්—මාත්තු රත්රන්
(73) එනැමල් කරාබු ජෝඩුවක්—මාත්තු රත්රන්
(74) එනැමල් මුද්දක්—මාත්තු රත්රන්
(75) ඉමිටේෂන් ගල් ඇල්ලූ මුද්දක්—මාත්තු රත්රන්
(76) මාත්තු රත්රන් මුද්දක්
(77) එනැමල් මාලයක්—මාත්තු රත්රන්
(78) ඉමිටේෂන් ගල් ඇල්ලූ මාලයක්—මාත්තු රත්රන්
(79) අමතර මූනත් කෑලි නවයක්ද, අමතර ප්ලාස්ටික් පටි නවයක්ද සහිත ඔර්ලෝසුවකින් යුත් පැන්ඩන්ට් එකක්, හා ඉමිටේෂන් දම්වැලක්, මෙම ඔර්ලෝසුවට සරිලන මූනත් කෑල්ලක් සහිත ඉමිටේෂන් දම්වැලක්ද අමතරව ඇත.
(80) සුදුගල් ඇල්ලූ සුදු රත්රන් පෙන්ඩන්ට් එකක් සහිත පබලු මාලයක්
(81) රතුකැටයක් ඇල්ලූ මුද්දක්—මාත්තු රත්රන්
(82) ස්ටාර් රතුකැට ඇල්ලූ මුද්දක්—මාත්තු රත්රන්
(83) ගාතට් ඇල්ලූ මුද්දක්—මාත්තු රත්රන්
(84) ගාතට් පහක් සහිත බ්‍රෝච් එකක්—මාත්තු රත්රන්
(85) තරුකැට (ස්ටාර් සැෆයර්) එකක් සහිත මුද්දක්—මාත්තු රත්රන්
(86) ගලක් ඇල්ලූ පෙන්ඩන්ට් එකක් සමග දම්වැලක්—මාත්තු රත්රන්
(87) ගල් ඇල්ලූ බ්‍රෝච් එකක්—මාත්තු රත්රන්
(88) තරුකැට (ස්ටාර් සැෆයර්) සුදුගල් ඇල්ලූ සුදු රත්රන් බ්‍රෙස්ලට් එකක් (පලුදුවී ඇත).
(89) තරුකැට (ස්ටාර් සැෆයර්), නිල්කැට ඇල්ලූ සුදු රත්රන් මුද්දක්
(90) තරුකැට (ස්ටාර් සැෆයර්) ඇල්ලූ කරාබු ජෝඩුවක් මාත්තු රත්රන්
(91) මූන්ස්ටෝන් මුද්දක්—මාත්තු රත්රන්
(92) නිල් කැට තුනක් ඇල්ලූ මුද්දක්—මාත්තු රත්රන්
(93) නිල් කැටයක් ඇල්ලූ මුද්දක්—මාත්තු රත්රන්
(94) ගාතට් එකක් ඇල්ලූ මුද්දක්—මාත්තු රත්රන්
(95) නිල්කැටයක් ඇල්ලූ මුද්දක්—මාත්තු රත්රන්
(96) ඇමතිස්ට් ඇල්ලූ මුද්දක්—මාත්තු රත්රන් (පොකුරු මුද්දක්)
(97) තරුකැට (ස්ටාර් සැෆයර්)යක් ඇල්ලූ මුද්දක්—මාත්තු රත්රන්
(98) කුඩා 'කැට්ස් අයි' ගල් ඇල්ලූ පෙන්ඩන්ට් එකක් සහිත දම්වැලක්—මාත්තු රත්රන්
(99) තරුකැට (ස්ටාර් සැෆයර්) එකක් සහිත මුද්දක්—මාත්තු රත්රන්
(100) ගල් ඇල්ලූ පෙන්ඩන්ට් එකක් සහිත දම්වැලක්—මාත්තු රත්රන්
(101) රන් මුද්දක්
(102) කරාබු ජෝඩුවක්—මාත්තු රත්රන්

2. ඒ ඒ බඩු වෙන්දේසිකර හමාරවූ වහාම භාරගත් ලංසුවට ගැනෙන මුදල සම්පූර්ණයෙන්ම ගෙවූවිට බඩු ඉවත්කරගෙන යාමට දෙනු ලැබේ.

3. කොළඹ ශ්‍රී ලංකා රේගුවේ ගාස්තු නිලධාරියාගෙන් වැඩිමනත් විස්තර ලබාගත හැක.

ජී. ඒ. ද සොයිසා,
ප්‍රධාන රේගුවේ අයකැමි වෙනුවට.

බිඹ/73/අප්‍රි./ සවර්—වෙන්දේසිය,
1973 මාර්තු මස
කොළඹ 1,
ශ්‍රී ලංකා රේගුවේ දීය.

3–1117—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ එෆ්1 විකිණීම් ගුදමෙහි තැන්පත් පහත සඳහන් බඩු 1973 අප්‍රේල් මස 11 වෙනි දින පෙ. ව. 9.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 අප්‍රේල් මස 10 වෙනි දින එම බඩු ගැණුම්කරුවනට පරීක්ෂා කර බැලීමට පිළිවන.

ඉල්ලීම අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් මිලයට ගන්නා භාණ්ඩයෙහි වාටිනාකමින් 50% ක මුදලක් තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

වෙන්දේසි පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වෙනි දින ගැසට් පත්‍රය බලන්න.

පී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඩී/විකිණීම්/95.
1973 මාර්තු මස 20 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

1. ග්‍රයින්ඩින් වීල් 3 යි
2. කලිසම් ගාන්චු පැකට් 55 යි
3. ආයුර්වේද බෙහෙත් මලු 1 යි
4. රබර් පැකින් රින්ග්ස් 205 යි
5. හම් මිටි 1 යි
6. පිත්තල බෝල 4 යි
7. යන්ත්‍ර කොටස් කැබලි 5 යි
8. "බෙලින්" විදුලි උදුන් 1 යි
9. "සිප් සීට් රබ්" පෙට්ටි 28 යි
10. කපු නූල් කෝන් 36 යි
11. "ටෙම්ප්‍රා බ්‍රොජ්ස්" පෙට්ටි 1 යි
12. ෆ්ලොරසන් ට්‍යුබ් 57 යි
13. රසායන ද්‍රව්‍ය කෑන් 10 යි
14. බැටරි ප්ලේට් 30 යි
16. සුදු සිමෙන්ති උර 2 යි
17. රසායන ද්‍රව්‍ය ඩ්‍රම් 1 යි
18. රසායන ද්‍රව්‍ය මලු 1 යි
19. රසායන ද්‍රව්‍ය මලු 1 යි
20. රසායන ද්‍රව්‍ය මලු 1 යි
21. හිස් පීප්ප 1 යි
22. රසායන ද්‍රව්‍ය ඩ්‍රම් 1 යි
23. ලිපිගොනු කවර 600 යි
24. කඩදාසි රෝල් 1 යි
25. රසායන ද්‍රව්‍ය ඩ්‍රම් 1 යි
26. මුද්‍රණ යන්ත්‍ර කොටස් පෙට්ටි 1 යි
27. රසායන ද්‍රව්‍ය ඩ්‍රම් 1 යි
28. ගිණිපෙට්ටි කඩදාසි රෝල් 1 යි
29. ප්‍රචාරක ද්‍රව්‍ය කාටූන් 1 යි
30. රසායනද්‍රව්‍ය (කෘමිනාශක) කෑන් 38 යි
31. ඊසල් ඔයිල් ටින් 68 යි
32. රසායන ද්‍රව්‍ය (පෙනිසිලින් පෙති) බෝතල 26 යි
33. ප්‍රචාරක ද්‍රව්‍ය පෙට්ටි 1 යි
34. ලිපිගොනු කවර 6 යි
36. තෙල් ලාම්පු 1 යි
37. විදුලි උපකරණ (රේඩියෝ කන්ට්‍රෝල්) පෙට්ටි 1 යි
38. මෝටර් රථ කොටස් පෙට්ටි 1 යි
39. කාර් බැටරි පෙට්ටි 1 යි
40. රසායන ද්‍රව්‍ය බෝතල 8 යි
41. පොත් (12 යි) පෙට්ටි 1 යි
42. මුද්‍රිත ද්‍රව්‍ය පෙට්ටි 1 යි
43. නාන කාමර උපකරණ පෙට්ටි 1 යි
46. යන්ත්‍ර කොටස් මලු 2 යි
47. ඇණ සහ මුරිච්චි මලු 1 යි
48. යන්ත්‍ර අමතර කොටස් පෙට්ටි 2 යි
49. ට්‍රැක්ටර් කොටස් පෙට්ටි 1 යි
50. ටයර් 36 යි
51. කපු නූල් මලු 3 යි
52. ඉන්ගට් 37 යි
53. රේසර්ස් පෙට්ටි 1 යි
54. ග්ලූකෝස් ඩ්‍රම් 36 යි
55. ප්‍රචාරක ද්‍රව්‍ය තොග 1 යි
56. රබර් රින්ග්ස් මලු 1 යි
57. කඩදාසි රීල් 1 යි
58. "ටේබල් සෑෂ්" පෙට්ටි 1 යි
59. හාඩ් බෝඩ් තොග 1 යි
60. සිල් පැකට් 12 යි
62. නූල් මලු 3 යි
63. පේපර් බෝඩ් මිටි 1 යි.
64. ට්‍යුබ් මලු 1 යි
65. අමතර කොටස් තොග 1 යි
66. ලී හැඩල් පෙට්ටි 1 යි
67. ට්‍යුබ් තොග 1 යි
68. හිස් බෝතල පෙට්ටි 1 යි
69. කඩදාසි රීල් 18 යි
70. වල්කනයිසින් රබර් කාටූන් 1 යි
71. චිම්නි 35 යි
72. යන්ත්‍ර කොටස් පෙට්ටි 5 යි
73. සෝඩා ඇෂ් මලු 125 යි
74. බෙන්ටොනයිට් මලු 300 යි
76. රසායන ද්‍රව්‍ය කාටූන් 1 යි
77. රසායන ද්‍රව්‍ය පෙට් ටි1 යි
78. යකඩ කැබලි 3 යි
79. රබර් රින්ග්ස් මලු 1 යි
81. පොත් පෙට්ටි 1 යි
83. ඩී. ඩී. ටී. කුඩු මලු 1 යි
84. ස්පිල් රින්ග්ස් මිටි 1 යි
85. යකඩ පයිප්ප කැබලි 1 යි
87. බෙහෙත් සබන් කාටූන් 35 යි.

3-1209—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රසිද්ධ වෙන්දේසිය—ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය, කොළඹ**

පහත සඳහන් භාණ්ඩ 1973 අප්‍රේල් මස 21 වන දින ප. ව. 12.30 ට මෙම උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි. එම භාණ්ඩ එදින දවල් 12 ට බැලීමට හැකිවේ. ගැනුම්කරුවන් විසින් මුදලින් ගෙවීම කළයුතු අතර, ඒ දිනම භාණ්ඩ ඉවත් කරගත යුතුය.

| නඩු අංක | | භාණ්ඩ විස්තර |
|---|---|---|
| පී. 757 | ... | බෝට්ටුවකට සවිකරන මැෂින් එකක් අංක 518287 |
| | | පා පැදි සහ පා පැදි කැබිලි |
| පී. 775 | ... | අංක බී. එච්. 32150 |
| පී. 776 | ... | 58922 |
| පී. 777 | ... | අංක සඳහන් කර නැත |
| පී. 781 | ... | ජේ. 3577 |
| පී. 782 | ... | සී.ඩී. 5638 |
| පී. 783 | ... | සී.වී. 45672 |
| පී. 784 | ... | ඩී.ඩී. 70765 |
| පී. 794 | ... | අංක 88657 |
| පී. 805 | ... | ඇෆ්ජ.ඊ. 417714 |
| පී. 806 | ... | ඇස්. 00609 |
| පී. 807 | ... | ඩී. 82528 |
| පී. 808 | ... | ඕ.සී. 96760 |
| පී. 828 | ... | 46864 |
| පී. 829 | ... | ටී.එස්. 1661 |
| පී. 834 | ... | ඒ.වී. 55563 |

| නඩු අංක | | අයිතිකරුවන් නැති භාණ්ඩ |
|---|---|---|
| පී. 786 | ... | මේස ඔර්ලෝසුවක් |
| පී. 791 | ... | නිකල් පටිය සහිත අත් ඔර්ලෝසුවක් |
| පී. 797 | ... | ඔර්ලෝසුවක් |
| පී. 804 | ... | අත් ඔර්ලෝසුවක් |
| පී. 810 | ... | පිත්තල කරාමයක් |
| පී. 811 | ... | ට්‍යුබ් එකක් |
| පී. 814 | ... | අත් කියතක් |
| පී. 821 | ... | භූමිතෙල් උඳුනක කොටස් |
| පී. 824 | ... | හිස් ගෝනි 17 ක් |
| පී. 832 | ... | සාප්පු බඩු පාර්සලයක් |
| පී. 833 | ... | ලොරි වේල් ලයිට් එකක් |
| පී. 837 | ... | හබ් කැප් එකක් |
| පී. 840 | ... | ඇලුමිනියම් පයිප්ප කැබලි මිටියක් |
| 12345/බී | ... | සාප්පු බඩු පෙට්ටි 5 ක් |
| 8660/සී | ... | සූට්කේස් එකක් පිඟන් 33 ක් |
| 21218/සී | ... | සූට්කේස් එකක් |
| 17973/ඒ | ... | ඇවිලස් මැටල් පිල්ටිස් ටින් 27 ක් |
| 39321/ඒ | ... | සූට්කේස් එකක් |
| 44185/ඒ | ... | බෝතල 5 ක් |
| 24156/ඒ | ... | සූට්කේස් දෙකක් |

මෙයට අමතර භාණ්ඩ සඳහා ලැයිස්තු විකිණීමේ දිනට පෙර දින මෙම කාර්යාලයේදී බැලිය හැක.

ඩී. ඊ. ධර්මසේකර,
කොළඹ, ප්‍රධාන මහෙස්ත්‍රාත්.

1973 මාර්තු මස 15 වැනි දින,
කොළඹ, ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

3-1128—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

1973 අප්‍රේල් 10 වෙනි අඟහරුවාදා පෙරවරු 10 ට කෝපායි එළිමහන් සිරකඳවුරේ රට සුදු ඌරන් සහ ඌරු පැටව් විකිණීමට තිබේ. මෙම ඌරන් විකිණීමෙන් පසු වහාම ගෙනයා යුතුයි. මෙම සතුන් සතියේ දිනවල කාර්යාලය වේලාවන් වලදී කෝපායි එළිමහන් සිර කඳවුරේදී බැලීමට පුළුවන.

කේ. තංගරාජා,
බන්ධනාගාර අධිකාරී.

1973 මාර්තු මස 10 වැනි දින,
යාපනය බන්ධනාගාරය.

3–1133—73.03.30 දින අංක 53 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදනා බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයක් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව |
|---|---|---|
| මාර්තු | ... 73. 3. 2 සිකුරාද | ... 73. 2. 2 බදාදා දවල් 12.00 |
| | 73. 3. 9 සිකුරාද | ... 73. 2.28 බදාදා දවල් 12.00 |
| | 73. 3.16 සිකුරාද | ... 73. 3. 7 බදාදා දවල් 12.00 |
| | 73. 3.23 සිකුරාද | ... 73. 3.14 බදාදා දවල් 12.00 |
| | 73. 3.30 සිකුරාද | ... 73. 3.21 බදාදා දවල් 12.00 |
| අප්‍රේල් | ... 73. 4. 6 සිකුරාද | ... 73. 3.28 බදාදා දවල් 12.00 |
| | 73. 4.11 බදාදා | ... 73. 4. 4 බදාදා දවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්දා | ... 73. 4.11 බදාදා දවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද | ... 73. 4.18 බදාදා දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.